# ශ්‍රී ලංකාවේ ප්‍රධාන පස් කාණ්ඩ

විනීතා විජයරත්න
(බී. එස්. සී. කෘෂිකර්ම ගෞරව) මහත්මිය විසිනි.

පසක ඇති භෞතික හා රසායනික ලක්ෂණ අනුව එම පසින් ගත හැකි කෘෂිකාර්මික මෙන්ම කාර්මික ප්‍රයෝජනද වෙනස් වේ. මේ නිසා පස් වර්ග පිළිබඳ අවබෝධය පාංශු විද්‍යාව පිළිබඳ කෙරෙන අධ්‍යයනයන්හිදී ඉතා වැදගත් තැනක් ගනී.

ලංකාවේ පස් වර්ග කිරීම පිණිස උත්සාහයන් කිහිපයක් ගෙන ඇති අතර ආචාර්ය එෆ්. ආර්. මූර්මන් හා ආචාර්ය සී. ආර්. පානබොක්කේ විසින් 1961 දී කරන ලද වර්ගීකරණය අද ප්‍රයෝජනයට ගැනේ. මෙම වර්ගීකරණයට අනුව ලංකාවේ පස් ප්‍රධාන පස් කාණ්ඩ ගණනාවකට බෙදා ඇත.

පාංශු ජනනයට හේතු වන ප්‍රධාන සාධක අතරට දේශගුණයද අයත් වන බව ඔබ දන්නා කරුණකි. ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප යටතේ දක්නට ලැබෙන පස් කාණ්ඩ අතර වෙනස්කම් දක්නට ලැබෙන්නේද පාංශු ජනනයේදී දේශගුණය දක්වන බලපෑම නිසාය. එමෙන්ම සමහරවිට එකම පස් කාණ්ඩයට අයත් පස් වෙනස් දේශගුණික ලක්ෂණ ඇති ප්‍රදේශවල දක්නට ලැබේ. එයට හේතුව පාංශු ජනනයට දේශගුණය මෙන්ම මාතෘ පාෂාණයේ ලක්ෂණ, කාලය, සත්වයින් හා ශාක සහ පිහිටීම යන සාධකද බලපෑමයි.

1. වියළි කලාපය හා අර්ධ වියළි අතරමැදි කලාපය.
2. තෙත් කලාපය හා අර්ධ තෙත් අතරමැදි කලාපය

යන කොටස් දෙකට අයත් ප්‍රධාන පස් කාණ්ඩ වල පැතිරුම, ඒවායේ ගති ලක්ෂණ හා කෘෂි කාර්මික විභවය සළකා බලමු.

වියළි කලාපයේ හා අර්ධ වියළි අතරමැදි කලාපයේ දක්නට ලැබෙන මහා පස් කාණ්ඩ:

## 1. රතු දුඹුරු පස්

වියළි කලාපයේ ප්‍රධානම තැනක් ගන්නේ මේ පස් වර්ගයයි. උප පසේ.

(අ) බොරලු රහිත.

(ආ) බොරලු මධ්‍යස්ථ ප්‍රමාණයක් සහිත.

(ඇ) අධික ප්‍රමාණයක් බොරලු සහිත.

යනුවෙන් උප කාණ්ඩ තුනක් හඳුනාගෙන ඇත.

අනුරාධපුර, මොණරාගල, වවුනියාව, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, හම්බන්තොට පුත්තලම, මන්නාරම, අම්පාර, මඩකලපුව, යන දිස්ත්‍රික්කවල බහුලව දක්නට ලැබේ. ඒ හැර කුරුණෑගල, මහනුවර, මාතලේ, හා රත්නපුර යන දිස්ත්‍රික්කවලද ඇත.

රතු සිට දුඹුරු දක්වා වෙනස් වන වර්ණයකින් යුක්ත මෙම පස මධ්‍යස්ථ සියුම් වයනයක් දරයි. ජලවහන තත්වය හොඳ සිට අසම්පූර්ණ තෙක් වෙනස් වෙයි. මතුපිට පස තෙත්ව ඇති විටදී කැඩෙන සුළුය. ලබා ගත හැකි ජල ප්‍රමාණය අඩුය. මතුපිට පසේ පාංශු ප්‍රතික්‍රියාව යන්තම් ආම්ලික සිට උදාසීන තෙක් වෙනස් වේ. පසේ කැටායන හුවමාරු ධාරිතාව පස් ගෑම් 100 ට මිලි සමක 10 - 20 අතර වේ. දැනට මේ පස් කැලෑ වගාවට හා හේන් ගොවි තැනට යොදාගෙන ඇත. මහ කන්නයේ වැසි ජලයෙන් ධාන්‍ය හා මාෂ බෝගද, ජල සම්පාදනය යටතේ අතිරේක ආහාර බෝග හා වී ද වගා කෙරේ.




මෙම පස මහ කන්නයේ අතිරේක ජල සම්පාදනය සහිතව හෝ රහිතව උක්, දුම්කොල, එඬරු හා අහස් දියෙන් කෙරෙන වී ගොවිතැනද යලට ජලසම්පාදනය සහිතව මිරිස්, ඇනූ, රට කජු කපු, එළවළු හා සෝයා බෝංචිද බොරලු අධික උප පසක් සහිත කොටස්වල සිට්‍රස් කුලයේ ශාක, අඹ, පැපොල් හා කෙසෙල් යන පළතුරුද වගා කිරීමේ විභවයක් ඇත. අසම්පූර්ණ ජල වහනයක් සහිත කොටස් මඩ වී හා තෘණවැවීමට යොදා ගත හැක.

## 2. කැල්සියම් රහිත දුඹුරු පස

ප්‍රධාන වශයෙන්ම දක්නට ලැබෙන්නේ අම්පාරේ හා මඩකලපු දිස්ත්‍රික්කවලය. ඒ හැර කුරුණෑගල' පුත්තලම, මොණරාගල, පොළොන්නරුව' ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලද දැකිය හැක.

මෙම පසේ වර්ණය දුඹුරු සිට කහ තෙක් වෙනස් වේ. මධ්‍යස්ථ වයනයක් දරයි. ජල වහන තත්වය හා මතුපිට පසේ පාංශු ප්‍රතික්‍රියාව රතු දුඹුරු පසට සමානය. ලබා ගත හැකි ජල ප්‍රමාණය අඩුය. පසේ කැටායන හුවමාරු ධාරිතාව පස් ග්‍රෑම් 100 ට මිලි සමක 5-15 තෙක් වෙනස් වේ. කැලෑ, හේන්, ජල සම්පාදනය සහිතව කෙරෙන වී, උක් හා අතිරේක බෝග යන වගාවන්ට යොදාගෙන ඇත. කෘෂි කාර්මික විභවයද රතු දුඹුරු පසට බෙහෙවින් සමානය. නොගැඹුරු පස් කොටස් තෘණ, අරළු-බුලු-නෙල්ලි යන ආයුර්වේද බෝග හා බීඩි නිෂ්පාදනයට ගන්නා කුඩුම්බෙරිය වගා කිරීමට යොදා ගත හැක.

## 3. තෙතමනය අඩු මැටි පස

අළු පැහැ වර්ණයක් ගන්නා මෙම පස, මධ්‍යස්ථ සියුම් වහනයක් සහිත වේ. ජල වහනය දුර්වලය. ලබා ගත හැකි ජල ප්‍රමාණය මධ්‍යස්ථය. මතුපිට පසේ පාංශු ප්‍රතික්‍රියාව යන්තම් ආම්ලික වේ. පසේ කැටායන හුවමාරු ධාරිතාව පස් ග්‍රෑම් 100 ට මිලි සමක 15 – 30 අතර වේ.

මාතලේ, බදුල්ල, මහනුවර, රත්නපුර යන දිස්ත්‍රික්කවල හැර රතු දුඹුරු පස් ඇති සෑම ප්‍රදේශයකම වාගේ මෙම පස් කාණ්ඩයද දක්නට ලැබේ. ප්‍රධාන වශයෙන්ම' යොදාගෙන ඇත්තේ ජල සම්පාදනය රහිතව හෝ සහිතව කෙරෙන වී වගාවටය. කැලෑ හා තෘණද දක්නට ලැබේ. අතිරේක ජල සම්පාදනය සහිතව තෘණ වගා කලහැක.

## 4. රතු-කහ ලැටසොල්ස්

යාපනය, මන්නාරම, පුත්තලම හා වවුනියා යන දිස්ත්‍රික්කවල දක්නට ලැබේ.

රතු ලැටසොලස් වුවමනාවටත් වැඩි ජලවහනයක් සහිත මධ්‍යස්ථ සියුම් වයනයක් දරණ ඉතා ගැඹුරු පසකි. කහ ලැටසොල්ස්වල ජලවහන තත්වය අසම්පූර්ණ සිට දුර්වල තෙක් වෙනස් වේ. අනිත් ලක්ෂණ සමානය. මතුපිට පසේ පාංශු ප්‍රතික්‍රියාව මදක් ආම්ලික වේ. කැටයාන හුවමාරු ධාරිතාව පස් ග්‍රෑම් 100 ට මිලි සමක 2 – 6 කි. ලබා ගත හැකි ජල ප්‍රමාණය ඉතා අඩුය.

ප්‍රධාන වශයෙන්ම යොදාගෙන ඇත්තේ කැලෑ හා හේන් වගාවන්ටය. සුළු ප්‍රමාණයක ජල සම්පාදනය සහිතව මිරිස්, ළූණු, රට කජු හා පොල් වගා කර ඇත. ජල සම්පාදනය සහිතව මිරිස්, ළූනු, රට කජු හා දුම්කොල වගා කිරීමට ඉතා හොඳ පසකි. වැසි ජලයෙන් කජු වගා කිරීමටද, අතිරේකව ජලය සැපයිය හැකි නම් සිට්‍රස් කුලයේ බෝග වැවීමටද ඉතා හොඳය. හොඳ වර්ෂාපතන ව්‍යාප්තියක් ඇත්නම් පොල් හා අඹ වගා කළහැක. මේ සෑම බෝගයකින්ම වැඩි අස්වැන්නක් රතු ලැටසොල්ස්වල වගා කළවිට ලබාගත හැක.

## 5. කැල්සික් රතු-කහ ලැටසොල්ස්

යාපනය දිස්ත්‍රික්කයේ වැඩිපුරම ඇති මහා පස් කාණ්ඩයයි. රතු පැහැයක් ගන්නා මෙම කැල්සික් රතු ලැටසෝල්ස් පසේ ගැඹුර පිහිටන ස්ථානය අනුව විවිධ වේ. ජලවහන තත්වයත් රතු-කහ ලැටසොල්ස්වලට සමානය. සියුම් වයනයක් සහිත මෙම පසේ ලබා ගත හැකි ජල ප්‍රමාණය අඩුය. මතුපිට පසේ පාංශු ප්‍රතික්‍රියාව උදාසීන හෝ යන්තම් ආම්ලික වේ. කැටායන හුවමාරු ධාරිතාව පස් ග්‍රෑම් 100 ට මිලි සමක 15 – 20 කි.

මිරිස්, ළූනු හා දුම්කොළ වගාවන්ට යොදා ගෙන ඇත. සුළු පරිමාණව තල් හා අඹ වගා කර ඇත. දැනට තල් වගා කර ඇති කොටස් වල දුම්කොළ හා අතිරේක ආහාර බෝග වගා කිරීමට විභවයක් ඇත.

## 6. අපරිනිත දුඹුරු ලෝහ පස්

මොණරාගල, මාතලේ, බදුල්ල, මහනුවර, රත්නපුර, හම්බන්තොට හා බිබිලේ යන දිස්ත්‍රික්කවල පැතිරී ඇත. වර්ණය තද දුඹුරු තෙක් වෙනස් වේ. හොඳින් ජලවහනය වන මෙම පසේ ගැඹුර අඩුය. මධ්‍යස්ථ සියුම් වයනයකින් යුක්තය. මදක් ආම්ලිකය. ලබා ගත හැකි ජල ප්‍රමාණය අඩුය. කැටායන හුවමාරු ධාරිතාව පස් ග්‍රෑම් 100 ට මි.ස. 10–20 තෙක් වෙනස් වේ.

දැනට කැලෑ හා හේන් ගොවිතැනට යොදා ගෙන ඇත. සංරක්ෂණ කටයුතු සඳහා කැලෑ වැවීමටත් සෑහෙන ප්‍රමාණයක් ජලය ලබා ගත හැකි ස්ථානවලදී පළතුරු වැවීමටත් සුදුසුය. බිබිලේ හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකේ මෙම පස් සහිත පෙදෙස අරලු බුලු නෙල්ලි යන බෝග වගා වත්ත යොදා ගත හැක.

## 7 ග්‍රුමෝ සෝල්ස්

මන්නාරම හා යාපනය දිස්ත්‍රික්කවල දක්නට ලැබෙන මෙම මහා පස් කාණ්ඩයේ වර්ණය තද අලු දුඹුරු සිට කලු තෙක් වෙනස් වේ. තරමක් ගැඹුරු මැටිමය වයනයක් දක්වන පසකි. තෙත්ව ඇති විට ඉතාමත් ඇලෙන සුලුය. වියළි විට ඉතා තද බවක් දක්වයි එමෙන්ම වියලෙන විට පස ඉරි තැලී යයි. මතුපිට පසේ පාංශු ප්‍රතික්‍රියාව මධ්‍යස්ථ සිට යන්තම් ආම්ලික තෙක් වෙනස් වේ. කැටායන හුවමාරු ධාරිතාව ඉතා ඉහළය (පස් ග්‍රෑම 100 ට මි.ස. 55-65). ලබා ගත හැකි ජල ප්‍රමාණයද අධිකය.

මහ වී වගාව සීමාසහිතව කෙරේ. ජල සම්පාදනය සහිතව වී වගා කිරීමටත් මහදී අගල් හා මැටි ක්‍රමයට බිම සකසා මැටි මත පළතුරු හා මාෂ බෝග වැවීමට හෝ යලේදී ජල සම්පාදන සහිතව මේ බෝග වැවීමට විභවයක් ඇත.

## 8 Solodized solonetz

හම්බන්තොට, ත්‍රිකුණාමලය, මොණරාගල, මන්නාරම, යාපනය හා පුත්තලම යන දිස්ත්‍රික්කවල පැතිරි ඇති මෙම පස් කාණ්ඩයේ වර්ණය දුඹුරු සිට තද දුඹුරු තෙක් වෙනස් වේ. මධ්‍යස්ථ රළු වයනයක් දරයි. මතුපිට පස යන්තම් ආම්ලික වේ. උප පස ක්ෂාරීය ස්වභාවයක් ගන්නා අලු පැහැ එකකි. එහි විචිත්‍ර ස්වභාවයක්ද දක්නට ලැබේ. දුර්වල ජලවහන ගුණ දක්වයි ලබා ගත හැකි ජල ප්‍රමාණය අඩුය. කැටායන හුවමාරු ධාරිතාව පස් ග්‍රෑම 100 ට මි ස. 15 - අතර වේ.

දැනට වැසි දියෙන් වී වගා කෙරේ. ඒ හැර මෙම පසෙහි ජලවහන තත්වය දියුණු කළවිට වී වගාවට හෝ තෘණ වගාවට යොදා ගත හැක.

## 9. Solonchaks

මන්නාරම, යාපනය, ත්‍රිකුණාමලය හා පුත්තලම යන දිස්ත්‍රික්කවල පැතිරී ඇත. වර්ණය තද දුඹුරු සිට අලු පැහැය තෙක් වෙනස් වේ. විචිත්‍ර ස්වභාවයක් පස් පැතිකඩයේ දැකිය හැක. පාංශු ප්‍රතික්‍රියාව මධ්‍යස්ථ සිට අධික ක්ෂාරය තෙක් වෙනස් වේ. ලබා ගත හැකි ජල ප්‍රමාණය අඩුය. කැටයන හුවමාරු ධාරිතාව 10 - 25 අතර වේ.

දැනට වැසි දියෙන් මෙන්ම ජල සම්පාදන සහිතවද වී වගා කෙරේ. පුනරුත්ථාපනය කිරීමෙන් සතුටුදායක ලෙස ජල සම්පාදන සහිතව කෙරෙන වී වගාවට හෝ තෘණ වගාවට යොදා ගත හැක.

## 10. Regosols

මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පුත්තලම, මන්නාරම හා යාපනය යන දිස්ත්‍රික්කවල වෙරළබඩ ප්‍රදේශයන්හි මේ පස් කාණ්ඩය දැකිය හැක (වෙරළ හා වැලි කඳු ලෙස). ඉතා ගැඹුරු වැලිමය වයනයක් සහිත පසකි. පැහැය සුදුය. ජලවහනය ඉතා අධිකය. පාංශු ප්‍රතික්‍රියාව උදාසීනය. කැටායන හුවමාරු ධාරිතාව ඉතා අඩුය (පස් ග්‍රෑම 100 ට මි ස 2 ට අඩුය). ලබා ගත හැකි ජල ප්‍රමාණයද ඉතා අඩුය.

දැනට පොල්' කජු, ලඳු හා කැලෑ
මේ පස් ඇති ස්ථානවල දැකිය හැක.
ඉතා ගැඹුරුව නොපිහිටන ස්ථානවල පොල් හෝ කජු හොඳින් වගා කළ හැක.
අනිකුත් ප්‍රදේශ විනෝදය සඳහා කෙරෙන කටයුතු වලට යොදා ගත හැක.

(තෙත් කලාපයේ හා අර්ධ තෙත් අතරමැදි කලාපයේ පැතිරී ඇති ප්‍රධාන පස් කාණ්ඩ ගැන මීළඟ කලාපයෙන් විමසා බලමු.)

# කෘෂි-රසායන භාවිතය හා යන්ත්‍ර නඩත්තුව

**වල්පැල පලිබෝධ හා රෝග මර්ධනය සඳහා කුඩු සහ ද්‍රව ඉසීමට යොදන යන්ත්‍ර භාවිතයේදී හා නඩත්තුවේදී අප සිහි තබා ගතයුතු දේ.**

රසායන ද්‍රව්‍ය මගින් කෙරෙන වල් පැල, පලිබෝධ හා රෝග මර්ධන ක්‍රියාවන් නිසි අයුරින් හා කාර්යක්ෂමව ඉටුකර ගැනීමට මෙන්ම යන්ත්‍ර දිගු කලක් භාවිතා කළ හැකි වනු පිණිසද මෙම කරුණු වැදගත් වේ. යන්ත්‍ර භාවිතා කිරීමට පෙර ඇණ, මුරිච්චි ආදිය හොඳින් සවිකර ඇත්දැයි පිරික්සා බැලීම පළමු වෙන්ම කළ යුතුය. මේවා නිසි ලෙස සවි වී නැත්නම් වැඩය අතරමග දී නතර කිරීමට සිදු වීමෙන් කාලය අපතේ යනවා පමණක් නොව ඉසින ද්‍රව්‍යය පුරවා තිබියදී යන්ත්‍රය සැකසීමට යාමෙන් ඒවා අපතේ යාමත්, සිරුරේ තැවරීමත් සිදු වේ.

බලවේග සහිත යන්ත්‍රයක් නම් ඊලඟට කළ යුත්තේ නියම අනුපාතයට මිශ්‍ර කළ ඉන්ධන, ඉන්ධන ටැංකියට දමා මධ්‍යස්ථ වේගයක් ඇති

වන සේ ඇක්සිලේටරය සකසා, එන්ජිමට ඉන්ධන එන නලය හැර යන්ත්‍රය පණ ගන්වා එන්ජිම හොඳින් ක්‍රියා කරන්නේදැයි බැලීමයි.

කුඩු ඉසින යන්ත්‍රයක් නම් නිශ්ක්‍රිය කුඩු දන්නා ප්‍රමාණයක් යොද තමා දන්නා ක්ෂේත්‍රයක් තුල සාමාන්‍ය වේගයෙන් ඇවිදිමින් කුඩු ඉසීම කළ යුතුවේ. තමාට අවශ්‍ය ක්ෂේත්‍රය තුල නියමිත කුඩු ප්‍රමාණය විදීමට නම් කෙතරම් වේගයකින් යන්ත්‍රයෙන් කුඩු පිටවිය යුතුදැයි මේ මගින් නිගමනය කළ හැක නියාමකය මගින් කුඩු පිටවන වේගය පාලනය කළ හැක. අවශ්‍ය නම් එන්ජිමේ වේගය ද වෙනස් කරමින් කුඩු පිටවෙන වේගය වෙනස් කළ හැක. නියමිත වේගය නිගමනය කළ පසු නියාමකය ඒ අනුව දිගටම ක්‍රියා කරන ලෙස සැකසිය යුතුය. ද්‍රව ඉසින යන්ත්‍ර භාවිතයේදී මේ කාර්යය සඳහා ජලය යොද ගත යුතුය. නිශ්ක්‍රිය කුඩු හෝ ජලය යොදගෙන මෙය කරන විටදී යන්ත්‍රයෙන් කාන්දුවීම සිද වන්නේදැයි පිරික්සන්න. විෂ සහිත ද්‍රව්‍ය යෙදීම කරන නිසා කාන්දු වීම් වැලැක්වීම ඉතා වැදගත් වේ.

යම් හෙයකින් වගා බිමට යෙදීමට නියමිත නාශක ප්‍රමාණය බීම පුරාම වරක් යෙදීමෙන් අවසන්ව නැති බව පෙනී ගියහොත් අඩු වේගයකින් කුඩු හෝ ද්‍රව්‍ය පිට වන සේ යන්ත්‍රය සකසා ඉතිරි ප්‍රමාණය නැවතත් මුළු බිමටම යොදන්න.

## නඩත්තුව

නාශක යෙදීම අවසන් කළ විගසම ටැංකිය හිස් කරන්න කඩු ඉසින යන්ත්‍රයක් නම්, ටැංකිය වියලිව තැබීමට මතක තබා ගත යුතුය. නැතිනම් ඊලඟ දිනයේදී කුඩු ගුලි ගැසීම සිදු විය හැක. ද්‍රව ඉසින යන්ත්‍ර වලට නඩත්තුවේදී වැඩි සැලකිල්ලක් යොමු කළ යුතුය. නාශක ද්‍රව නිසා යන්ත්‍රය විඛාදනයට භාජනය විය හැකි නිසා ප්‍රවේසම් විය යුතුය. සෑම දිනකම නාශක යොද අවසානයේදී ටැංකිය ජලයෙන් පුරවා නල, නැසිනි ආදිය හොඳින් සේදෙන සේ ජලය පොම්ප කිරීම කරන්න. කපාට ආදිය ඇර ද්‍රව්‍ය හොඳින් ඉවත් කර, පසුව ජලය ඉවත්ව යන සේ මිනිත්තු කිහිපයක් වාතය පොම්ප වීමට ඉඩ හැරිය යුතුය. සෑම නැසිත්තක්ම ගලවා පිරිසිදු කරන්න. මේවා පැරෆින් ඉටිවල දමා තැබිය හැකි නම් වඩාත් හොඳය.

හිස් ටැංකිය වසා තැබීමට මතක තබා ගන්න. නැතිනම් රොඩු පංකාව සහිත කොටසෙහි එකතු වීමෙන් හානි ඇති විය හැක. පංකාව මත්ථය වැනි ක්‍රියාකාරී කොටස් ස්නේහනය කරන්න. කුඩු ඉසින ද්‍රව්‍ය වල කුඩු දමන ටැංකියට ස්නේහක නොයන ලෙස ප්‍රවේශමින් යොදන්න. නැතිනම් ටැංකිය තෙත් වීමෙන් කුඩු යෙදූ විට ගුලි ගැහීමට පුළුවන්. වැඩිපුර තෙල් හා ග්‍රීස් ඉවත් කරන්න.

## ආරක්ෂක පියවර

යන්ත්‍රයේ පටි සහිත කොටස් වෙනම් ඒවා හොඳින් තදවී ඇත්දැයි පිරික්සන්න. අවශ්‍ය නම් අලුත් ඒවා යොදන්න. නැතිනම් කප්පි යොද තද කළ හැක. සෑම කන්නයක් අගදීම ක්‍රියාකාරී කොටස් පැරෆින් යොද සෝදන්න. එන්ජිමෙන් ඉන්ධන ඉවත් කර නිරාවරණය වන කොටස් වල ග්‍රීස් ගැල්විය යුතුය. හොඳින් පිරිසිදු කර ගෙවීගිය කොටස් ඉවත් කර අලුත් කොටස් දැමිය යුතුය. යන්ත්‍රය නිෂ්පාදකයාගේ අවවාද පරිදි නියමිත කාලයේදී අලුත්වැඩියා කිරීම ඉතා වැදගත්.

**පලිබෝධ නාශක භාවිතයේදී ඔබේ ආරක්ෂාවට ගත යුතු පියවර:** පලිබෝධ නාශක ජීව විද්‍යාත්මකව විෂ ඇති කරන ද්‍රව්‍යයන් බැවින් මිනිසා ඇතුළු අනික් සියලුම ජීවීන් කෙරෙහි විෂ ඇති කරවන සුළුය චර්මය, ආහාර මාර්ගය හෝ ශ්වසන පද්ධතිය තුලින් මේ ද්‍රව්‍යය ශරීර ගත විය හැක. වමනය යාම, කැරකිල්ල වැනි ලක්ෂණ මේවා ශරීර ගතවූ විට මූලිකවම දක්නට ලැබෙන රෝග ලක්ෂණයයි. එහෙත් සමහරවිට රෝගලක්ෂණ ඇතිවීමටසෑහෙනතරම්ප්‍රමාණයක් එකවර ශරීර ගත නොවීමට ඉඩ ඇත. සමහර පලිබෝධ නාශක ශරීරය තුල එකතු වීමද සිදු වේ. එකවර විෂ සහිත ප්‍රමාණයක් ශරීර ගත නොවූනත් ටික ටික එකතු වී විෂ සහිත තත්වයකට පත්වීම මෙලෙස සිදුවිය හැක. ආසනික් අඩංගු නාශක මෙයට හොඳ නිදසුනකි. ඒ නිසා මේ ද්‍රව්‍යය භාවිතයේදී රෝග ලක්ෂණ ඇති නොවූන පමණින්ම අනතුරුදායක තත්වයකින් මිදී ඇතැයි සිතීම උගහටය. විශේෂයෙන්ම මේ ද්‍රව්‍යය නිතර නිතර යොදනවා නම් වඩාත් ආරක්ෂාකාරී විය යුතුයි.

නාශක භාවිතයේදී අවස්ථා කීපයකදීම

එනම්;

- I මිශ්‍ර කිරීමේදී හා තනුක කිරීමේදී
- II ක්ෂේත්‍රයේදී යොදන විට
- III මේ ද්‍රව්‍යය යෙදූ ආහාර භාවිතයේදී
- IV නිවෙස්වල තබා ගැනීමේදී

ආරක්ෂක පියවර ගත යුතුයි.

**මිශ්‍ර කිරීමේදී හා තනුක කිරීමේදී ගත යුතු ආරක්ෂක පියවර:** මෙහිදී අධික සාන්ද්‍රණයකින් යුක්ත ද්‍රව්‍යය හා ගැටීම සිදු වන නිසා ඇති විය හැකි හානියද විශාලය. ඒ නිසා වඩාත් ප්‍රවේසම් විය යුතුයි. මෙහිදී නාශක ද්‍රව්‍යය ඇසිරුමෙහි දක්වා ඇති අවවාද ඒ අයුරින්ම පිලිපැදීමට අමතක නොකළ යුතුය. ඉක්මණින් /හොඳ ප්‍රතිඵලයක් ලබන්න සිතමින් වැඩි සාන්ද්‍රණයකින් ද්‍රාවණය සාදා ගැනීම අනතුරුදායකය. ඉන් ඉසීම කරනු ලබන්නාට හානි ඇති වීමට ඇති හැකියාව වැඩි වනවා මෙන්ම වගාවටත් විෂ සහිත වීමට ඉඩ ඇත. මිශ්‍ර කිරීමේදී අත් වැසුම් භාවිතා කළ හැකි නම් එය ආරක්ෂාකාරී පියවරක් වනු ඇත. ප්‍රවේසමින්, ඉවසිලි වන්තව මිශ්‍ර කළ යුතුයි. විශේෂයෙන්ම කුඩු වර්ග එකවර හැලුවොත් සෑම තැනම විසිරී යා හැකි බැවින් වඩා සැලකිලිමත් විය යුතුයි. සුළං සහිත ස්ථානයක සිට කුඩු වර්ග මිශ්‍ර කිරීමත් එතරම් නුවණට හුරු නැත. කිසි විටෙකත් අතින් මිශ්‍ර කිරීම නොකළ යුතුයි. ඒ සඳහා ලීයක් වැනි දෙයක් යොදගන්න. මිශ්‍ර කිරීම අවසන් කළ වහාම නාශක ද්‍රව්‍යය තැවරුණු තැන් හොඳින් සෝදා ගන්න.

**ක්ෂේත්‍රයේදී යොදන විට ගත යුතු ආරක්ෂක පියවර:** ක්ෂේත්‍රයේදී යොදන විට ආරක්ෂක ඇඳුම් පැලඳිය හැකි නම් ඉතාමත් හොඳයි. ශ්වසන පද්ධතියට හා චර්මයට නාශක ඇතුලු වීම මේ ඇඳුම් මගින් වැලකී යනු ඇත. දියුණු රටවල නම් මෙය නොවරදවාම කරන දෙයකි. එහෙත් අපේ රටේ සමහර ගොවීන්ට පලිබෝධ නාශක ගන්න තරම්වත් වත්කමක් නැති තත්වයක් පවතින නිසා මෙවැන්නකට මුදල් වැය කිරීම අසීරුය. ඒ නිසා අනිකුත් ආරක්ෂක ක්‍රම වෙත වඩාත් සිත යොමු කළ යුතුය. අනික් අතට අපේ රටේ පවත්නා අධික උෂ්ණය නිසා රබර් වැනි ද්‍රව්‍ය වලින් නිෂ්පාදිත මේ ඇඳුම් පැළඳගෙන වැඩ කිරීමත් පහසු දෙයක් නොවේ. මේ ඇඳුම් භාවිතා කළ නොහැකි වුවත් නාශක ද්‍රව්‍යය කෙලින්ම ඔබේ සිරුරේ ගැටීම වලක්වා ගැනීමට හැකිතාක් සිරුර ආවරණය කර ගන්න. තුවාල ආදිය ඇත්නම් වඩාත් ප්‍රවේසම් විය යුතුයි.

නාශක යොදන විට සුළං හමන අතට මුහුණලා යෙදීමෙන් වලකින්න. එවිට ඒ ද්‍රව්‍යය සුළං සමග වීත් ඔබේ සිරුරේ ගැටේ. මේ අයුරින් ශ්වසන පද්ධතිය තුළින් නාශක ශරීර ගතවීම පහසුවෙන් සිදු වෙන්න පුළුවන්. අධිකව සුළං ඇති විට යෙදීමෙන්ද වැළකිය යුතුයි. එවිට වාතයට නාශක මිශ්‍ර වීම වැඩියෙන් සිදු වේ. ඉන් පරිසරය දූෂණය වනවා පමණක් නොව ද්‍රව්‍ය අපතේ යාමත් සිදු වේ.

නාශක යොදන අතරතුරදී ආහාර ගැනීමෙන් වළකින්න අමතක නොකරන්න. බුලත්විට කෑම ආදියට ඇබ්බැහි වූ පුද්ගලයින් මෙය වඩාත් හොඳින් සිහියේ තබාගත යුතුයි. යෙදීම අවසන් වූ වහාම හොඳින් පිරිසිදු වීමටත්, ඇඳුම් පිරිසිදු කර ගැනීමටත් මතක තබාගන්න. එකදිගට පලිබෝධ නාශක යෙදීම නොකළ යුතු දෙයක්. ඔබ නොදැනුවත්වම මොනම ක්‍රමයකින් හෝ මේ ද්‍රව්‍යය ඔබේ ශරීර ගත වන්න පුළුවන්. දිගු කලක් අඛණ්ඩව යොදන විට මේවා ටික ටික ශරීරය තුල එකතු වී විෂ සහිත තත්වයකට පත් වන්න පුළුවන්. මෙසේ එකතු වීම වැළකුනොත් ටික කලකදී එම ද්‍රව්‍ය වල විෂ ගතිය නැතිවෙන්න පුළුවන. ඒ නිසා දිගටම යෙදීමෙන් වැළකීම වැදගත්.

**ආහාරයට ගැනීමේදී ගත යුතු ආරක්ෂක පියවර:** රසායන ද්‍රව්‍යයේ නිෂ්පාදකයා දක්වා ඇති සාන්ද්‍රණයෙන් හා නියම කර ඇති කාලාන්තර වලදී යෙදීම කළ යුතුය. අස්වැන්න නෙලීමට යම් කාලයකට පෙර නාශක යෙදීම නැවැත්විය යුතු බවට ඔබට අවවාද කර ඇත්නම් ( සාමාන්‍යයෙන් සති දෙකකට පෙර ) එසේ කිරීම ඉතාමත් වැදගත්. මේ අවවාද නොපිළිපැදීම නිසා ඇති වන අනතුරු ගැන ඔබ අසා තිබෙනවා විය හැක. මේ අවවාද පිළිපැදීමෙන් අවශේෂ ක්‍රියා මගින් පාරිභෝගිකයාට විෂ ඇති වීම වළක්වා ගන්න පුළුවන.

රසායන ද්‍රව්‍යය භාවිතා කිරීම අද සෑම ගොවිපලකම වාගේ කෙරෙන දෙයකි. ඒ නිසා ගොවිපලෙන් ඔබට ලැබෙන ආහාර ද්‍රව්‍යය භාවිතයට ගැනීමට පෙර හොඳින් සෝදන්න අමතක නොකරන්න. පලිබෝධක නාශක යොදා ගබඩා කළ ද්‍රව්‍ය පරිභෝජනයේදී වඩාත් ප්‍රවේසම් විය යුතුයි. ගබඩා කරන ද්‍රව්‍යයන්ට යෙදීමේදී සාන්ද්‍රණය ගැන වඩා සැළකිලිමත් විය යුතුයි. ගබඩා ගෙවල් තුලම ඇත්නම්, නිතර නිතර ඔබ ඒවාට ඇතුල් වනවා නම්, ඔබ නොදැනුවත්වම ඔබේ ජීවිතයට අනතුරක් ලබා කර ගන්නා බව මතක තබා ගන්න.

(38 පිටුව බලන්න)

# උසස් පෙළට කෘෂි විද්‍යා දැනුම

(22 වෙනි පිට හා සම්බන්ධයි.)

නැවත බීජ ද්‍රව්‍යය ලෙස භාවිතා කිරීම සඳහා ගන්නා බීජ ආදියට වැඩි සාන්ද්‍රණයකින් යුක්තව රසායන ද්‍රව්‍ය මිශ්‍ර කිරීම සාමාන්‍ය යෙන් කෙරෙන දෙයකි. සමහර විට මෙවැනි බීජ රජය මගින් බෙද දුන් විට ආහාර හිඟකම නිසා ආහාරයට ගැනීම හෝ අලෙවි කිරීම සමහරුන් කරන දෙයකි. මෙවැනි දේ නිසා ඇති වූ විනාශයන් ගැන වෙනත් රටවලින් ද ලැබෙන වාර්තා ඔබ කියවා ඇති. ඒ නිසා කිසි විටෙකත් පැළ කිරීමට දෙන බීජ වැනි දේ ආහාරයට ගැනීම හෝ ඒවා ආහාර සඳහා අලෙවි කර අනිකෙකුගේ ජීවිතයට අනතුරක් කිරීම හෝ නොකළ යුතුය.

**නිවෙස්වල තබා ගැනීමේදී ගතයුතු ආරක්ෂක පියවර:** නිවසේ කුඩා දරුවන් ඇත්නම් ඔබ වඩාත් ප්‍රවේසම් විය යුතුය. කිසි විටෙකත් දරුවන්ට ළං විය හැකි ස්ථානවල මේවා නොතැබිය යුතුය. තේරුම් ගතහැකි වයසේ දරුවන්ට මේ ද්‍රව්‍යය බෙහෙවින් විෂ සහිත වන බව තේරුම් කර දෙන්න. ආහාරයට ගන්නා ද්‍රව්‍ය තබන ස්ථානවල මේ ද්‍රව්‍ය තැබීමෙන් වළකින්න. හිස් පැකට් ආදිය විනාශ කර දමන්න. තෛලෝද වැනි නාශක අඩංගු බෝතල ආදිය පිරිසිදු කිරීම ඉතා අපහසුයි. එම නිසා ඒවා තිබූ බෝතල භාවිතයට නොගන්නවා නම් එය වඩා උචිත වේ. විශේෂ යෙන්ම ආහාරයට ගන්නා ද්‍රව්‍යය. උදා: පොල් තෙල් දැමීමට එම බෝතල් භාවිතා කිරීම අනතුරුදායකය.